# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. UVP/BD/E/PS/HP/2021/31 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021-මැයි-14 දින. |

ජාතික විගණන උප කාර්යාලය
මහා නගර සභාව
බදුල්ල.

සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එස්.එම්.විජේරත්න
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත:- පළාත් පාලන කොමසාරිස්, ඌව පළාත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. UVP/BD /E/PS/HP/2021/31    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2021 ජූලි /4 දින.

ජාතික විගණන උප කාර්යාලය

මහා නගර සභාව

බදුල්ල

සභාපති,

හපුතලේ ප්‍රාදේශීය සභාව.

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශ වලින් 2020 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

(i) ඉකුත් වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) සඳහා ලැබී තිබුණු රු.1,631,000 ක් සභාවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු කර්මාන්ත අත රැඳවුම් රු. 78 ,825 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙසට දක්වා තිබුණි. මෙසේ ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවීය.

(iii) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 2,433,882 ක් වුවද, එය මූල්‍ය හා මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ රු.2,263,812 ක් ලෙසට රු.170,070 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු ආදායම රු.694,617 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේදී නව වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමර 10 ක වැඩිදියුණු කිරීම් සඳහා වැයකර තිබුණු රු.339,622 ක් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම් වල දක්වා නොතිබුණි.

(vi) ඉකුත් වර්ෂයට අදාල වෛද්‍යාධාර හා කර්මාන්ත ආධාර වියදම් රු.222,108 ක් වෙනුවෙන් ගිණුම්වල ණයහිමි ප්‍රතිපාදන නොසලසා අදාල ගෙවීම් කර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 <u>අනුකූල නොවීම්</u>

### <u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්</u>

නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | | |
| | 134 වගන්තිය | 182,443 | දියුණු කළ ප්‍රදේශ වශයෙන් සභාව ප්‍රකාශයට පත් කරනලද ප්‍රදේශ ඇතුළත පිහිටි වරිපනම් බදු ඒකක 621 ක වසර 02 කට වැඩි කාලයක සිට හිඟහිට ඇති වරිපනම් ගාස්තු අය කරගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති සහ 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 3 (ඉ) ඡේදයේ | 62,956 | සේවය කර විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මියගිය නිලධාරින්ගේ ඇපකරුවන්ගෙන් හිඟ ණය ශේෂ අය කරගත යුතු වුවද, සේවකයින් 11 දෙනෙකුගෙන් 2015 වර්ෂයේ සිට අයවීම හිඟහිට ඇති සේවක ණය අය කරගෙන නොතිබුණි. |
| (ඇ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | 4,841,000 | සමාලෝචිත වර්ෂයේදී වීථි ආලෝකකරණය වෙනුවෙන් වීථි පහන් මිලදී ගැනීම සඳහා වැය කල මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට විදුලි බල මණ්ඩලය සමඟ සහාව ගිවිසුමකට එළඹ නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 නොවැම්බර් 29 දිනැති අංක 2152 දරන ගැසට් පත්‍රය | 49,729 | සභා සීමාව තුල පවත්වාගෙන යනු ලබන සිනමා ශාලාවෙන් නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් සියයට 10 ක විනෝද බද්දක් සමාලෝචිත වර්ෂය සඳහා අය කර ගත යුතු වුවද,සභාව 2017 වර්ෂයේ ගැසට් පත්‍රයේ පල කරන ලද සියයට 7.5 ක ප්‍රතිශතය පදනම් කරගෙන විනෝද බදු අය කර තිබුණු බැවින්, 2019 සහ 2020 වර්ෂ වල පාඩුවක් සිදුව තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,802,170 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,651,624ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,849,454 ක් පිරිහීමක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2020 | | | | 2019 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් දිනට හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් බදු | 1,563,024 | 1,563,024 | 1,102,192 | 460.832 | 1,580,057 | 1,580,057 | 1,344,921 | 235,136 |
| ii | කුලී | 1,770,526 | 1,770,526 | 1,949,038 | නැත | 1,508,040 | 1,508,040 | 1,633,270 | නැත |
| iii | බලපත්‍ර ගාස්තු | 700,000 | 700,000 | 722,145 | නැත | 790,300 | 790,300 | 1,332,295 | නැත |
| iv | වෙනත් ආදායම් | 16,361,700 | 16,361,700 | 12,113,811 | 4,247,889 | 11.323,000 | 11,323,000 | 11,711,644 | නැත |
| | එකතුව | 20,395,250 | 20,395,250 | 15,887,186 | 4,708,721 | 15,201,397 | 15,201,397 | 16,022,130 | 235,136 |

### 2.2.2 වරිපනම් බදු

වසර 02 කට අධික කාලයක සිට පැවත එන, හිඟ හිටි වරිපනම් බදු රු.172,231 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි.

### 2.2.3 කුලී

වසර 02 කට අධික කාලයක සිට පැවත එන, හිඟ හිටි කුලී රු. 105,275 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 1,378,313 ක් සහ මුද්දර ගාස්තු රු. 4,942,296 ක් අය කරගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### තිරසර සංවර්ධන ඉලක්ක

සභාව එක්සත් ජාතීන්ගේ " තිරසර සංවර්ධන න්‍යායපත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වසරකට අධික කාලයක සිට පැවත එන කර්මාන්ත ණය හිමියෝ රු.98,825 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ එක් තනතුරක පුරප්පාඩුවක් පුරවා නොතිබුණු අතර, තනතුරු 02 කට අදාළව 11 දෙනෙකුගෙන් සමන්විත අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරගෙනද නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2016 දෙසැම්බර් 01 දින සිට 2017 අප්‍රේල් 30 තෙක් කාලයට අදාලව මසකට රු.102,702 ක බදු මුදලකට වෙළඳාම් කටයුතු සඳහා, සභාවේ ගව මස් කඩය කුලියට දීමට 2016 මැයි 01 දින බදුකරු සමඟ සභාව ගිවිසුමකට එළඹ තිබුණි.එහෙත් ගිවිසුම අනුව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.143,783 ක හිඟ බදු මුදල් හා දඩ මුදල් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කල ආදායම් හා වියදම්,වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 23 සිට සියයට 44 දක්වාද, වියදම් විෂයයන් 05 ක සියයට 21 සිට සියයට 50 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

එස්.එම්.විජේරත්න
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත - පළාත් පාලන කොමසාරිස්,ඌව පළාත.